# කොළඹ අධ්‍යාපන කලාපය

**අවසාන වාර ඇගයීම - 2016**

**නාට්‍ය හා රංග කලාව - 13 ශ්‍රේණිය**

**I පත්‍රය**

පැය එක යි.

## I කොටස

**විභාග අංකය :-** ..................                                        **පන්තිය :-** ..................

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින්, නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය, ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

---

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා පහත නාමාවලිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| *A-* | *දිට්ඨමංගලිකා* | *D-* | *කරදිය* | *G-* | *Swan lake* |
| *B-* | *සත්‍යග්‍රහ* | *E-* | *මානසවිල* | *H-* | *දෙපානෝ* |
| *C-* | *කැලෑමල්* | *F-* | *කුවේණි අස්න* | *I-* | *Sleeping Beauty* |

01) ඉහත නාමාවලිය අතරින් බැලේ නිර්මාණ දෙකක් වන්නේ,

1) A හා B ය.    2) C හා D ය.    3) E හා F ය.
4) G හා I ය.    5) H හා I ය.

(..............)

02) "F" අක්ෂරයෙන් දැක්වෙන නාමය අයත් වන්නේ පහත සඳහන් ගණයන් ගෙන් කුමකට ද?

1) කාව්‍ය නිර්මාණ ගණයට ය.    2) ගීත නාට්‍ය ගණයට ය.    3) මුද්‍රා නාට්‍ය ගණයට ය.
4) ඔපෙරා නාට්‍ය ගණයට ය.    5) නෘත්ත ගණයට ය.

(..............)

03) එස්. පණිභාරත සූරින් විසින් නිර්මාණය කළ මුද්‍රා නාට්‍යය දැක්වෙන අක්ෂරය කුමක් ද?

1) A ය.    2) B ය.    3) C ය.    4) D ය.    5) E ය.

(..............)

04) 'C' හා 'H' අක්ෂරවලින් දැක්වෙන්නේ,

1) මුද්‍රා නාට්‍ය නාමයන් ය.    2) ඔපෙරා නාට්‍ය නාමයන් ය.    3) ගීත නාට්‍ය නාමයන් ය.
4) බැලේ නාට්‍ය නාමයන් ය.    5) වේදිකා නාට්‍ය නාමයන් ය.

(..............)

05) දේශීය හා විදේශීය ඔපෙරා නිර්මාණ දෙකක් දැක්වෙන අක්ෂර වන්නේ,

1) A හා D ය.    2) E හා B ය.    3) C හා F ය.
4) G හා E ය.    5) C හා D ය.

(..............)

06) ස්වභාවික වාදී නාට්‍ය රීතියේ පුරෝගාමියා වනුයේ,

1) අන්ද්‍රෙ අන්තොයින් ය.    2) හෙන්රි බෙක් ය.    3) එමිල් සෝලා ය.
4) මැක්සිම් ගෝර්කි ය.    5) ඇන්ටන් චෙකොෆ් ය.

(..............)

07) නාට්‍ය පෙළ රචනයේ දී අත්‍යවශ්‍ය ම සාධකයක් නොවනුයේ,

1) නාට්‍ය පෙළ හුදෙක්ම ප්‍රේක්ෂකයා අරමුණු කරගෙන නිර්මාණය වීම ය.
2) සංවාද හා රංග විධාන වලින් සමන්විත වීම ය.
3) වාච්‍යාර්ථ අභිබවා ව්‍යංගාර්ථ දනවන ප්‍රාණවත් බස් වහරක් යොදාගත යුතු වීම ය.
4) මුල, මැද, අග වශයෙන් සිද්ධි පිළිවෙලින් ගැලපීම ය.
5) චරිත අන්තර්ගත වී තිබීම ය.

(..............)

The National e-learning Portal for The General Education

08) රූපණය සම්බන්ධ නිවැරදි කරුණක් නොවන්නේ,

1) රූපණ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා රංග අභ්‍යාස ඉවහල් වේ.
2) රූපණ කාර්යය සඳහා නළුවෙකු තුළ ප්‍රතිභාවක් තිබිය යුතු වේ.
3) රූපණ ශිල්පියාට තම කාර්යය කෙරෙහි ප්‍රේක්ෂක ප්‍රතිචාරය බෙහෙවින් බලපායි.
4) ව්‍යුත්පත්තිය රූපණය කෙරේ ඍජුවම බලපෑනු ලබයි.
5) රූපණය සඳහා සමාරෝපය අවශ්‍යම නැත.

(...............)

09) රූපණ වේදය පිළිබඳ (An Actor Prepairs) නළුවෙකුගේ පෙරහුරුව නම් කෘතිය රචනා කලේ,

1) භරත මුණි ය.
2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
3) සැමුවෙල් බෙකට් ය.
4) කොන්ස්ටන්ටින් ස්ටැනිස්ලාව්ස්කි ය.
5) රංජිත් ධර්මකීර්ති ය.

(...............)

10) ස්වභාව සෞන්දර්යය, ආදරයේ මහිමය, මනුෂ්‍ය ස්වභාවයේ ගූඪත්වය, සන්ත්‍රාසය ආදී විෂයයන් මනස තුළ ප්‍රහර්ෂයට නැංවීමක් සිදුකරන නාට්‍යය රීතිය වනුයේ,

1) තාත්ත්වික වාදී නාට්‍ය රීතිය යි.
2) යථාර්වාදී නාට්‍ය රීතිය යි.
3) රොමැන්ටික් නාට්‍ය රීතිය යි.
4) අද්භූත ජනක නාට්‍ය රීතිය යි.
5) අසම්මත නාට්‍ය රීතිය යි.

(...............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා පහත නාට්‍ය නාමාවලිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| *A-* | *යෙර්මා* | *D-* | *මෙන් විතවුට් ෂැඩෝ* | *G-* | *ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන්* |
| *B-* | *මැරේජ් ඔෆ් ෆිගාරෝ* | *E-* | *මදර් කරේජ්* | *H-* | *ෆිඩ්ලර් ඔන් ද රූෆ්* |
| *C-* | *මරාසාද්* | *F-* | *රන් ෆො යුවර් වයිෆ්* | *I-* | *ද බෙයාර්* |

11) මින් බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍ය නිර්මාණ වනුයේ,

1) A හා D ය. 2) E හා G ය. 3) C හා F ය. 4) B හා E ය. 5) H හා I ය.

(...............)

12) ඉහත නාට්‍ය නාමාවලිය අතරින් බෝහෝ මෑත කාලයේ පරිවර්තනය වූ නාට්‍යයක් වේ. වාදකයෙකු හා සම්බන්ධ වන කතා පුවතක් එහි වේ. එම නාට්‍ය වන්නේ,

1) A ය. 2) H ය. 3) I ය. 4) D ය. 5) F ය.

(...............)

13) 'I' අක්ෂරයෙන් දැක්වෙන නාට්‍යයේ මුල් රචකයා වන්නේ,

1) ඇන්ටන් චෙකොෆ් ය.
2) සැමුවෙල් බෙකට් ය.
3) හැරල්ට් පින්ටර් ය.
4) හෙන්රික් ඉබ්සන් ය.
5) එමිල් සෝලා ය.

(...............)

14) **"රෝමය ගිනි ගනී"** නම් ප්‍රහසන නාට්‍යයට ආශ්‍රය වූ මුල් කෘතිය දැක්වෙන අක්ෂරය වන්නේ,

1) I ය. 2) H ය. 3) G ය. 4) F ය. 5) E ය.

(...............)

15) **"බක්මහ අකුණු"** ලෙස හැඳින්වෙන නාමයෙන් අනුවර්තනය වුයේ,

1) 'A' අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය යි.
2) 'B' අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය යි.
3) 'C' අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය යි.
4) 'D' අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය යි.
5) 'E' අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය යි.

(...............)

16) පහත සඳහන් රූපණ ක්‍රියාවලින් අතරින් ස්ටැනිස්ලාව්ස්කිගේ රූපණ ක්‍රමවේදයට අයත් වන්නේ,

1) චරිතය වාර්තා කිරීම යි.
2) අතාර්කික චරිත රංගනය යි.
3) සවිඥානිකව අවිඥානික වීම යි.
4) නළු පෞරුෂය මතුකර පෙන්වීම යි.
5) අතිශයෝක්තියට ඉඩකඩ ලබා දීම යි.

(...............)

17) වේදිකාව මත යහපත් ප්‍රේක්ෂාවක් මවන විට ඊට අදාළ වන පහත සඳහන් අංග අතරින් ඉවත් වන අංගය වන්නේ කුමක් ද ?
1) රංගාලෝකය
2) අංග රචනය
3) නාට්‍ය පසුතලය
4) රංග වින්‍යාසය
5) සංගීතය
(...............)

18) "කන්නමි කියොත්සුගු" යනු,
1) කබුකි නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමී ආචාර්යවරයා ය.
2) නෝ නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමී ආචාර්යවරයා ය.
3) බුන්රකු නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමී ආචාර්යවරයා ය.
4) ක්යෝගන් නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමී ආචාර්යවරයා ය.
5) චීන ඔපෙරා නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමී ආචාර්යවරයා ය.
(...............)

19) පහත වගන්ති අතරින් ශේක්ස්පියර් ට්‍රැජඩිවලට පමණක් අදාළ වන වගන්තිය කුමක් ද?
1) බිය හා කාරුණ්‍ය ජනිත කරයි.
2) අවසානයේ කතා නායකයා මිය යයි.
3) කතා වින්‍යාසය ප්‍රධාන වේ.
4) ත්‍රිවිධ ඒකත්වය ගැන සැලකිලිමත් වේ.
5) ප්‍රේක්ෂාව අනවශ්‍ය දෙයක් ලෙස සලකයි.
(...............)

20) එපික් රංගයේ ලක්ෂණයක් නොවේ.
1) ජවනිකා හා අංකවලට බෙදීම.
2) ගීතයේ අර්ථය මතු නොකෙරෙන ගී තනු යෙදීම.
3) කථක භූමිකාව යොදා ගැනීම.
4) මුල, මැද, අග අනුපිළිවෙලට තිබීම.
5) සිදුවීම් වාර්තා කිරීම.
(...............)

21) අර්වින් පිස්කැටෝර් පුරෝගාමී වන්නේ කුමන නාට්‍ය රීතියකට ද?
1) අසම්මත නාට්‍ය රීතියට ය.
2) එපික් නාට්‍ය රීතියට ය.
3) යථාර්ථවාදී නාට්‍ය රීතියට ය.
4) ස්වභාවිකවාදී නාට්‍ය රීතියට ය.
5) රොමැන්ටික්වාදී නාට්‍ය රීතියට ය.
(...............)

22) "නෙම්බුත්සු ඔදොරි" යනුවෙන් හඳුන්වන්නේ,
1) ජපන් නෝ නාට්‍යය කි.
2) කබුකි වාද්‍ය භාණ්ඩය කි.
3) කබුකි නාට්‍යාරම්භක නර්තන විශේෂය කි.
4) නෝ වේදිකාවේ කොටසකි.
5) බුන්රකු නාට්‍ය සම්ප්‍රදායේ ගායකයින් හඳුන්වන නාමය යි.
(...............)

23) ඇරිස්ටොෆනීස්ගේ කොමඩි ආකෘතියට ම ආවේණික වූ අංගයකි.
1) පැරබේසිස් (Parabasis)
2) පැරඩෝස් (Parados)
3) ප්‍රෝලොග් (Prologue)
4) එක්සඩෝස් (Exodos)
5) එපිසෝඩ් (Episode)
(...............)

24) සංස්කෘත රංග ශෛලියේ ලක්ෂණයක් නොවන්නේ,
1) කක්ෂ්‍යා විභාගය භාවිතය යි.
2) චාරි නම් වූ පාද චලන භාවිතය යි.
3) හස්ත මුද්‍රා ක්‍රම භාවිතය යි.
4) වෙස් මුහුණු භාවිතය යි.
5) ස්ත්‍රීන් රංගනයට දායක වීම යි.
(...............)

**ප්‍රශ්න අංක 25-30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත දැක්වෙන තොරතුරු ගොනුව ආශ්‍රය කර ගන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| *A-* | *ජීවිත ගර්වය* | *B-* | *බෙන් ජොන්සන්* | *C-* | *හංසයාග* |
| *D-* | *ඌරුභංග* | *E-* | *ඔන්කොස්* | *F-* | *ඇල්කෙස්ටිස්* |
| *G-* | *අහස් තිරය* | *H-* | *තෙරේස් රැක්වින්* | *I-* | *මිත් ඔෆ් සිසිපස්* |

25) ස්වභාවික වාදය ගුරු කොට ගෙන එමිල්සෝලා විසින් රචිත නාට්‍යයක් වන්නේ,
1) A ය. 2) E ය. 3) H ය. 4) F ය. 5) I ය.
(...............)

26) 'I' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1) ඔතෙලෝ නාට්‍ය මූලාශ්‍රය කි.
2) බ්‍රෙෂ්ට් ගේ නාට්‍ය නිර්මාණය කි.
3) ස්ටැනිස්ලව්ස්කි ගේ රූපණ ක්‍රමවේදය ලියා තැබූ ග්‍රන්ථය කි.
4) ග්‍රීක වීර කාව්‍යය කි.
5) අසම්මත රංගය පිළිබඳ කරුණු ඇතුළත් ග්‍රන්ථය කි. (...............)

27) 'G' අක්ෂරයෙන් දැක්වෙන්නේ නූතන වේදිකාවක (Proscenium Theater) අංගයකි. එයට යෙදෙන තවත් නමක් වන්නේ,
1) සයික්ලෝරාමාව යි.
2) උඩු තිරය යි.
3) පැති තිරය යි.
4) ඉගිලුම් තිරය යි.
5) ඒප්‍රනය යි. (...............)

28) මධ්‍යකාලීන නාට්‍ය කලාව සමග සම්බන්ධ වන නාමයක් ඉහත වදන් අතර වේ. එයට අයත් අක්ෂරය කුමක් ද?
1) A ය.
2) B ය.
3) C ය.
4) D ය.
5) E ය. (...............)

29) 'F' අක්ෂරයෙන් සඳහන් වන්නේ ග්‍රීක නාට්‍යයක නමකි. එම නාට්‍යයේ රචකයා,
1) යුරිපිඩිස් ය.
2) ඊස්කිලස් ය.
3) තෙස්පිස් ය.
4) සොෆොක්ලීස් ය.
5) ඇරිස්ටොෆනීස් ය. (...............)

30) 'C' අක්ෂරයට අදාළ වගන්තිය තෝරන්න.
1) සංස්කෘත නාට්‍ය රචක නාමය කි.
2) සංස්කෘත රංගයේ මුද්‍රා ක්‍රමය කි.
3) සංස්කෘත උපරූපක වර්ගය කි.
4) සංස්කෘත නාට්‍ය සිද්ධාන්ත කෘතිය කි.
5) සංස්කෘත නාට්‍යයක නම කි. (...............)

31) ප්‍රාසාංගික කලා මාධ්‍ය හඳුනා ගැනීමේ නිර්ණායකවලට අයත් නොවන වැකිය තෝරන්න.
1) ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා වීම.
2) සජීවී වීම.
3) ශිල්පීය කුසලතා පෞරුෂය ප්‍රමුඛ වීම.
4) සංස්කරණය සිදුකර ඉදිරිපත් කිරීම.
5) බහුවිධ කලා එකතුවක් තිබීම. (...............)

32) සොෆොක්ලීස් විසින් රචිත **"තීබ නාට්‍ය ත්‍රිකය"** නම් වූ නාට්‍ය ත්‍රයක් ග්‍රීක නාට්‍ය සාහිත්‍යයට ඇතුළත් ය. එම ත්‍රිකයට ඇතුළත් එක් නාට්‍යයක් පහත නාට්‍ය අතර වේ. එය තෝරන්න.
1) බොයිෆොරෝයි
2) බැකී
3) ඊඩිපස් ඇට් කොලෝනස්
4) යූමිනයිඩීස්
5) පර්සියන්ස් (...............)

33) හිට්ලර්ගේ නාසි ව්‍යාපාරයට විරුද්ධ ලිපි ලේඛන හා කවි රචනා කිරීම නිසාත් මාක්ස්වාදී ව්‍යාපාරයට සම්බන්ධ වීම නිසාත් හිට්ලර්ගේ උදහසට ලක් වී තම මව් රටින් පලා යාමට සිදුවූ නාට්‍යකරු වනුයේ,
1) විලියම් ශේක්ස්පියර් ය.
2) හෙන්රික් ඉබ්සන් ය.
3) ඇන්ටන් චෙකොෆ් ය.
4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
5) කොන්ස්ටාන්ටින් ස්ටැනිස් ලාව්ස්කි ය. (...............)

34) නළුවා හා නිළිය තමා රඟපාන චරිතය ට උචිත පරිදි පාලනයෙන් යුක්ත ව තමන් කවරදා හෝ විඳින ලද අත්දැකීම් තුළට අවශ්‍ය විටක දී නැවතත් පිවිසීම හැඳින්වෙන්නේ,
1) පරිකල්පන ශක්තිය (Imagination) යනුවෙනි.
2) චිත්තවේග ස්මෘතිය (Emotion Memory) යනුවෙනි.
3) රූපණ විධි ක්‍රමය (Method of Acting) යනුවෙනි.
4) තදාත්ම විඝටනය (Alianation Effect) යනුවෙනි. (...............)

The National e-Learning Portal for The General Education

35) **"සන්ධිම"** යනු,

1) සංස්කෘත නාට්‍ය වල කතා වස්තුවට අදාළ අංගය කි.
2) සංස්කෘත නාට්‍ය වල නාට්‍යෝපකරණ වර්ගය කි.
3) සංස්කෘත නාට්‍ය වල රස සංකල්පනට අදාළ ව්‍යභිචාරී භාවය කි.
4) සංස්කෘත නාට්‍ය වල ආංගික අභිනය දැක්වීමේ ක්‍රමය කි.
5) සංස්කෘත නාට්‍ය වල රංග භූමියට අදාළ කොටස කි. (..............)

**ප්‍රශ්න අංක 36-40 ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

*A-* ***මියුතෝස්***    *B-* ***පෙරිපිටියා***    *C-* ***මිමෙසිස්***
*D-* ***තියට්‍රෝන්***    *E-* ***එක්යුක්ලිමා***    *F-* ***කෝමෝස්***

36) ග්‍රීක කොමඩිවල ප්‍රභවයට මුල් වූ නර්තන විධි දැක්වෙන අක්ෂරය වූයේ,

1) A ය. 2) C ය. 3) E ය.
4) B ය. 5) F ය. (..............)

37) ග්‍රීක කතා වින්‍යාසය සඳහා යෙදුනු වදනකි,

1) A ය. 2) B ය. 3) C ය.
4) D ය. 5) E ය. (..............)

38) 'D' අක්ෂරය යෙදෙන්නේ,

1) ග්‍රීක රංග භූමිය හැඳින්වීමට ය. 2) ග්‍රීක රංග වස්ත්‍රාභරණ හැඳින්වීමට ය.
3) ග්‍රීක වෙස් මුහුණු හැඳින්වීමට ය. 4) ග්‍රීක ප්‍රේක්ෂාගාරය හැඳින්වීමට ය.
5) ග්‍රීක රංග උපකරණයන් හැඳින්වීමට ය. (..............)

39) 'C' අක්ෂරයෙන් යෙදෙන වදනේ හි අරුත,

1) අනුකරණය යන්න ය. 2) ප්‍රත්‍යාවර්තනය යන්න ය.
3) කතා වින්‍යාසය යන්න ය. 4) ත්‍රිවිධ ඒකත්වය යන්න ය.
5) අන්වැරදීම යන්න ය. (..............)

40) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ **"තදාත්ම විඝටන"** අරමුණ ඉටුකර ගැනීම සඳහා රංගය ගොඩනැඟීමේ දී සිදුකල වෙනස්කමක් නොවනුයේ,

1) කථා නායක නායිකාවන් සම්මත ආකාරයේ වීරවරයන් ලෙස නිර්මාණය නොකිරීම ය.
2) නාට්‍යමය ජවනිකා රැසක් නිර්මාණය කිරීම ය.
3) ආඛ්‍යාන ශෛලියකින් කථාව ඉදිරිපත් කිරීම ය.
4) ස්ථාන හා කාල ඒකත්වයකින් යුතුව නිර්මාණය කිරීම ය.
5) සහානුභූතිය වෙනුවට හේතුවලවාදී වීම ය. (..............)

National e-learning Portal for The General Education

# කොළඹ අධ්‍යාපන කලාපය

**අවසාන වාර ඇගයීම - 2016**

**නාට්‍ය හා රංග කලාව - 13 ශ්‍රේණිය**

**I පත්‍රය**

*පැය දෙක යි.*

## II කොටස

**උපදෙස්**

- **A** හා **B** කොටස් වලින් එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන, සම්පූර්ණ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

01) 1) **"කලාව"** යනු කුමක් ද ? (ලකුණු 4 යි.)

2) කලාවේ විවිධ ප්‍රභේදවලින් ප්‍රධාන ප්‍රභේද **තුනක්** නම් කර, එම කලා ප්‍රභේදවල ලක්ෂණ වෙන් වෙන් වශයෙන් දක්වන්න. (ලකුණු 5 යි.)

3) විවිධ කලා මාධ්‍යයන් අතර නාට්‍ය කලාවේ සුවිශේෂිතාව පහදන්න. (ලකුණු 6 යි.)

02) 1) **"සතර අභිනය"** හා **"නාට්‍යයක රංග ශෛලිය"** යන සංකල්ප කෙටියෙන් පහදන්න. (ලකුණු 4 යි.)

2) "සතර අභිනය" සහ "නාට්‍ය ශෛලිය" අතර ඇති සහ සම්බන්ධය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

3) රූපණය පිළිබඳ ස්ටැනිස්ලාව්ස්කි ඉදිරිපත් කළ න්‍යායන් සඳහන් කර, භරතමුනි ඉදිරිපත් කළ සතර අභිනය සංකල්පය සමග එහි සමානරූපී බවක් ඇතැදැයි **විමසන්න.** (ලකුණු 6 යි.)

03) 1) **"නාට්‍ය"** හා **"රංග කලාව"** අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4 යි.)

2) **"නාට්‍ය තුළ ඇත්තේ අනුකරණ ක්‍රියාවලියක් වුව ද එහි නියත අනුකරණයක් සිදු නොවේ."** යන කියමන සනාථ කරමින් කරුණු දක්වන්න. (ලකුණු 5 යි.)

3) ලෝකයේ ව්‍යාප්ත ව පැවති විවිධ නාට්‍ය රීති අතරින් **තුනක්** නම් කර, එම නාට්‍ය රීති තුනෙහි ප්‍රමුඛ වන ලක්ෂණ පිළිබඳ විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 6 යි.)

## B කොටස

04) 1) **"කතා වස්තුව"** (Plot) යන්න සංස්කෘත හා ග්‍රීක පැහැදිලි කිරීම් අනුව කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 4 යි.)

2) ග්‍රීක ට්‍රැජඩියේ කතා වින්‍යාසයේ විශේෂතා මොනවාදැයි දක්වන්න. (ලකුණු 5 යි.)

3) සංස්කෘත නාට්‍යයක ක්‍රියා විකාශනය වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 6 යි.)

05) 1) නෝ නාට්‍ය හා එලිසබතීන නාට්‍යයන් රඟ දැක්වූ රංග භූමි හඳුන්වන්න. (ලකුණු 4 යි.)

2) එම රංග භූමිවල භාවිතා කළ විශේෂ රංගෝපක්‍රම පිළිබඳ විමසන්න. (ලකුණු 5 යි.)

3) නෝ සහ එලිසබතීන නාට්‍යවල රංග විලාසයන් පිළිබඳ සැසඳීමක් කරන්න. (ලකුණු 6 යි.)

06) 1) නාට්‍ය පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන හතරක් සඳහන් කරන්න. (ලකුණු 4 යි.)

2) නාට්‍යයක ගැටුම යන සංකල්පය පැහැදිලි කර විවිධ ගැටුම් අවස්ථාවන් නිදසුන් සමග දක්වන්න. (ලකුණු 5 යි.)

3) ඔබ හදාරා ඇති පෙරදිග සහ අපරදිග නාට්‍ය කෘති දෙකක් ඇසුරින් එම නාට්‍යවල ගැටුම් අවස්ථා ගොඩ නැගී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6 යි.)

# කොළඹ අධ්‍යාපන කලාපය
අවසාන වාර ඇගයීම - 2016
නාට්‍ය හා රංග කලාව - 13 ශ්‍රේණිය
II පත්‍රය

පැය තුනයි.

## I කොටස

උපදෙස්
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින්, නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය, ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත සංවාද ඛණ්ඩ ඇසුරු කර ගන්න.**

A- නෙක බල පරාක්‍රම ප්‍රතාපාලංකෘත වූ සුරේන්ද්‍රාධනාවට ගියා වූ දේව දූතයා වන මම මෙහි අවුත් සිටිනෙමි.

B- මේ අවේලාවේ ඔබ වහන්සේ මේ විමානයට වැඩියේ ඇයි?

C- ගොපරෙ නේවේ. උදරෙ, ලෙඩේ හැදිලා හත් අට මාසෙකට වැඩිය නෑ නේද? මේක හැදෙන කොට මුලින් ම ටික ටික හාල් වගේ ඒව කන්නා ආස තිතේනවා.

D- මහරජාණෙනි, මම නාගසේන යැයි දන්වමි.
සබ්‍රහ්මචාරීන් වහන්සේලාට මට නාගසේන යැයි කියති.

E- ගුරුන්නාන්සේ, මේක නියම නිකම් කණ්නාඩියක් නොවෙයි. මේක අලි බලන කණ්නාඩියක්, මේ කණ්නාඩියෙන් මට තව දෙයක් පේනවා.
සමහරු දරුවෝ එක්ක හිනා වෙනවා. සමහරු දරුවෝ නැතිව දුකින් ඉන්නවා.

F- ගුරුන්නාන්සේ, අර කියපු චිදියට අපි ගියා.
ඇතෙක් හොයන්න, ඒත් වැඩිවෙලා යන්න ඉස්සර අපට තිබහ හැදුනා. අනේ ගුරුන්නාන්සේ, වතුර බින්දුවක් නෑ කොහේවත්..................

G- මූ පින් ඇති වැද්දෙක්, මුට මුගේ පිනට දානයක් පහළ වෙලා.............

01) ඉහත සංවාද ඛණ්ඩ අතරින් මිලිඳු ඛණෙහි දක්නට ලැබෙන සංවාද ඛණ්ඩයක් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය. 5) E ය. (............)

02) **"ඇත් බන්ධනය"** නම් නාට්‍යමය පෙළපාලිය ට අයත් සංවාද ඛණ්ඩයක් වනුයේ,
1) E ය. 2) F ය. 3) G ය. 4) H ය. 5) B ය. (............)

03) 'G' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1) කොහොඹා කංකාරියේ යෙදෙන සංවාද ඛණ්ඩය කි.
2) රට යකුමේ යෙදෙන සංවාද ඛණ්ඩය කි.
3) සන්නියකුමේ යෙදෙන සංවාද ඛණ්ඩය කි.
4) සූනියම් යාගයේ යෙදෙන සංවාද ඛණ්ඩය කි.
5) දෙවොල් මඩුවේ යෙදෙන සංවාද ඛණ්ඩය කි.
(............)

04) 'A' අක්ෂරයෙන් දැක්වෙන සංවාද ඛණ්ඩය අන්තර්ගත වනුයේ,
1) ආලවක දමන ධර්ම දේශනාවෙහි ය.
2) සූවිසි විවරණයෙහි ය.
3) කාලි යක්ෂණී දමනයෙහි ය.
4) පිරිත් පිංකමෙහි ය.
5) දොරකඩ අස්නෙහි ය.
(............)

05) රට යකුමේ එන සංවාද ඛණ්ඩයක් වනුයේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය. 5) E ය. (............)

06) බෘහත් කතා, කථා සරිත් සාගරය, පාලි ධම්ම පදට්ඨ කතාව යනු මූලාශ්‍රවල ද සඳහන් වන කතා පුවත් ඇසුරින් නිර්මාණය කළ නාට්‍යයක් වේ.
1) අභිඥාන ශාකුන්තලය
2) රත්නාවලි
3) බව කඩතුරාව
4) හස්තිකාන්ත මන්තරේ
5) සඳ කිඳුරු
(............)

The National e-learning Portal for The General Education

07) 1929 දී සිංහල ශාස්ත්‍රීය සමිතියේ ශිෂ්‍යයන් විසින් පළමු සාංවත්සරික උත්සවයේ දී රඟ දක්වා ඇත්තේ,
1) කමලා නොහොත් රාළහාමිගේ බලාපොරොත්තුව නාට්‍යය යි.
2) සුනේත්‍රා නාට්‍යය යි.
3) දුටුගැමුණු නාට්‍යය යි.
4) මායාවති නාට්‍යය යි.
5) මාලනී නාට්‍යය යි. (............)

08) විශ්ව විද්‍යාල කොලපියේ නාට්‍ය සංගමය වෙනුවෙන් මහාචාර්ය ඊ.එෆ්.සී. ලුඩොවයික් මහතා විසින් නිෂ්පාදිත ඉංග්‍රිසි නාට්‍යයක් නොවනුයේ,
1) ස්පාඤ්ඤ ජාතික ක්වින්ටන් රෝ සහෝදරයන්ගේ "Where Women Rule"
2) ප්‍රංශ ජාතික මොලියර් ගේ "The Imaginary Invalid"
3) ඉංග්‍රිසි ජාතික විලියම් ශේක්ස්පියර්ගේ "The Merry Wives of Windsor"
4) ඉතාලි ජාතික ලුයිජි පිරැන්ඩෙලෝගේ "Right You are"
5) ජර්මන් ජාතික බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ "The Cocasian Chalk Circle" (............)

09) විශ්ව විද්‍යාලයීය සිංහල ශාස්ත්‍රීය සමිතිය විසින් ඉදිරිපත් කළ පරිවර්තන හෝ අනුවර්තන නාට්‍යයක් නොවනුයේ,
1) "ඉබේ වෙදා"
2) "යන්තම් ගැලවුනා"
3) "මැනේජර්"
4) "මඟුල් ප්‍රස්තාව"
5) "වළහා" (............)

අංක 10 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු ඇසුරු කරගන්න.

*A- කෝවලන්*
*B- අන්නාවියාර්*
*C- කලරි*
*D- මාරිඅම්මාන් දේවිතාවිය*
*E- තිරුවිලා*
*F- කාමන්කූත්තු*
*G- රාවනේසන්*
*H- මන්සුමන්තාමේනියාර්*

10) ද්‍රවිඩ නාට්‍ය කලාවේ දී කූත්තුවක රඟන පොතේ ගුරු හඳුන්වනු ලබන අක්ෂරය වනුයේ,
1) A ය. 2) B ය. 3) D ය. 4) E ය. 5) G ය. (............)

11) 'A' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1) වන්නි කලාපයේ ප්‍රචලිත නාට්‍ය වර්ගයකි.
2) යාපනය කලාපයේ ප්‍රචලිත නාට්‍ය වර්ගයකි.
3) මන්නාරම කලාපයේ ප්‍රචලිත නාට්‍ය වර්ගයකි.
4) හලාවත කලාපයේ ප්‍රචලිත නාට්‍ය වර්ගයකි.
5) මඩකලපුව කලාපයේ ප්‍රචලිත නාට්‍ය වර්ගයකි. (............)

12) 'C' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1) ද්‍රවිඩ රංගන විලාසයකි.
2) ද්‍රවිඩ නාට්‍යකරුවෙකුගේ නමකි.
3) වඩමෝඩියේ වේදිකාව හඳුන්වන නමකි.
4) තෙන්මෝඩියේ භාවිතා වූ වාද්‍ය භාණ්ඩයකි.
5) ද්‍රවිඩ පූජා කර්මයකි. (............)

13) කඳුකරයේ හින්දු කෝවිල්වල පැවැත්වූ උත්සවයක් පිළිබඳ දැක්වෙන අක්ෂරයක් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය. 5) E ය. (............)

14) එස්. විද්‍යානන්දන් නම් ද්‍රවිඩ නාට්‍යකරුවා විසින් නිර්මාණය කළ විශිෂ්ඨ නාට්‍ය නිර්මාණය කි.
1) A ය. 2) D ය. 3) E ය. 4) G ය. 5) H ය. (............)

15) මුළු ගම ම වේදිකාවක් කර ගනිමින් රඟ දැක්වූ නාට්‍ය සම්ප්‍රදායක් ගැන සඳහන් වන අක්ෂරය වන්නේ,
1) H ය. 2) G ය. 3) F ය. 4) E ය. 5) D ය. (............)

16) මධ්‍යකාලීන යුරෝපයේ බිහිවූ නාට්‍ය ප්‍රභේදය වනුයේ,
1) තාත්ත්වික වාදී නාට්‍ය යි.
2) යථාර්ථවාදී නාට්‍ය යි.
3) අද්භූත ජනක නාට්‍ය යි.
4) රොමැන්ටික් නාට්‍ය යි.
5) අසම්මත නාට්‍ය යි. (............)

- පහතින් දැක්වෙන්නේ ජපන් නාට්‍ය කලාවන් හා සම්බන්ධ අසම්පූර්ණ ප්‍රකාශ කිහිපයකි.

A- සමුරායිවරුන්ගේ අනුග්‍රහයෙන් දියුණු වූ නාට්‍ය විශේෂය කි.
B- නෝ නාට්‍යයට පෙර පැවති රංග සම්ප්‍රදායකි.
C- ස්ත්‍රී චරිත පවා රඟපානු ලබන්නේ පිරිමි නළුවන් විසිනි.
D- ක්යෝගන් නම් නාට්‍යාංගය එහි අන්තර්ගත ය.
E- හනමිචිය නම් වේදිකාංගය යොදා ගැනේ.

17) ඉහත ප්‍රකාශ අතුරින් කබුකි නාට්‍ය වලට අයත් වන ප්‍රකාශයන් වන්නේ,

1) ABC ය. 2) BCD ය. 3) CDE ය. 4) ACE ය. 5) BDE ය. (............)

18) විලියම් ශේක්ස්පියර්ගේ නාට්‍ය කෘති අතරට අයත් නොවන කෘතිය වන්නේ,

1) Midsummer night's dream ය.
2) King Lear ය.
3) Dr. Faustus ය.
4) King Richard the third ය.
5) The Tempest ය. (............)

19) මින් ස්වභාවිකවාදී නාට්‍යයක් නොවනුයේ,

1) ද බුචර්ස් (The Butchers)
2) ද වල්චර්ස් (The Vultures)
3) දොන් කාලෝස් (Don Carlos)
4) තෙරේස් රැක්වින් (Therese Raquin)
5) ලා පැරිසියන් (La Parisienne) (............)

- අංක 20 - 25 දක්වා ප්‍රශ්න වලට, පහත තොරතුරු ගොනුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| A- | අරගතෝ | B- | කිරිනෝ | C- | ජෝ | D- | ගෙස | E- | මොනොමනේ |
| F- | දෝකෙගත | G- | තයිකෝ | H- | කගුරා | I- | යුගෙන් | | |

20) කබුකි නාට්‍යවල රළු භාවයෙන් යුත් ශෛලිය හඳුන්වන නාමය වේ.

1) A ය. 2) C ය. 3) E ය. 4) H ය. 5) I ය. (............)

21) 'A' අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1) ජපන් නාට්‍යවල අනුකරණය හඳුන්වන ආකාරය යි.
2) නෝ නාට්‍යයේ වෙස් මුහුණු හඳුන්වනු නාමය යි.
3) කබුකි නාට්‍යවල කාන්තා චරිත හඳුන්වන ආකාරය යි.
4) ජපන් සංගීත විධියකි.
5) ජපන් රංග භූමියක කොටසකි. (............)

22) නෝ නාට්‍ය කලාව ගොඩනැඟීම ට පාදක වූ ජන නැටුම් විශේෂය කි.

1) I 2) H 3) G 4) F 5) E (............)

23) කබුකි නාට්‍යවල සංගීත විධියක් වේ.

1) A 2) B 3) C 4) D 5) E (............)

24) 'F' අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1) කබුකි නාට්‍යවල රංග ශෛලියකි.
2) කබුකි නාට්‍යවල යෙදෙන රංග භාණ්ඩ වර්ගයකි.
3) කබුකි නාට්‍යවල එන චරිත වර්ගයකි.
4) කබුකි නළු නාමයකි.
5) කබුකි වේදිකාවේ කොටසකි. (............)

25) නෝ නාට්‍යවල භාවිතා වන වාද්‍ය භාණ්ඩය දැක්වෙන අක්ෂරයකි.

1) G 2) E 3) F 4) G 5) H

(............)

**අංක 26-30 දක්වා ප්‍රශ්නවලට, පහත නාට්‍ය සංවාද ඛණ්ඩ ඇසුරින් පිළිතුරු සපයන්න.**

A- "ගැහැනියකට බලහත්කාරකම් කරන්නට තරම් මම මෝඩයෙක් නො වෙමි. ඇගේ චරිතයට සුදුසු පිළිවෙළට සුදුසු අවස්ථාවක එළඹෙන්නේ නම් කුමන ගැහැනිය සමග ද රමනයේ යෙදෙනු නොහැකි"

B- "ගෙන යව් මොවුන් නොවෙව් තවත් පමා, හැසිරෙනු ඇත. ඔවුන් දැන්වත් ගැහැනුන් විදියට බැඳ දමව් මුන්, මොන ජගතා වුනත් බයයි මරණය පැමිණෙන විට තමා බිලිගන්ට"

C- "ඔය ලේන්සුව, පජිප්තුකාරිය මගේ මෑණියන්ට දුන් එකක්, ඈ මිනිසුන්ගේ සිතුවිලි ගැනත් කීමට හැකි මන්ත්‍රකාරියක්"

D- "සියවස් ගණනාවකට පිවත් වූ උත්තරීතරම මිනිසාගේ නටඹුන් තමයි මේ, දරුණු අවාසනාව පතිත වේවි නිසැකවම ඔබේ වටිනා රුධිරය සෙලවූවන් මත"

E- "තාත්තා මාව විශ්වාස කරලා මට මන්තරේ ඉගෙන ගන්න කිව්වා. මම ඔබ සමග ගියොත් තාත්තාට ඒක ලොකු පහරක් වෙනවා"

F- "ඔබගොල්ලෝ යන්ඩ, මොකක්ද හිත යට හංගගෙන ඔබ කතා කරන්නේ, ඔයගොල්ලෝ කියන ඒවා අහන්න මට ඕනකමක් නෑ"

G- "ඒ රහස.................. මගේ සතුටත් ආඩම්බරයත් වෙනුවෙන් තිබුණ එකම වාසිය, අනේ ඉවරයි ! එයා මේක දැනගත්තොත්"

26) **"සුබ සහ යස"** නාට්‍යයට අයත් සංවාදය දැක්වෙනුයේ,

1) G අක්ෂරයෙනි. 2) C අක්ෂරයෙනි. 3) B අක්ෂරයෙනි. 4) A අක්ෂරයෙනි. 5) E අක්ෂරයෙනි.

(............)

27) 'B' අක්ෂරයෙන් සඳහන් සංවාදය අයත් නාට්‍යය වන්නේ,

1) ජුලියස් සීසර් නාට්‍යය යි. 2) ඇන්ටිගනි නාට්‍යය යි. 3) හස්තිකාන්ත මන්තරය නාට්‍යය යි.
4) ඊඩිපස් නාට්‍යය යි. 5) ඔතෙලෝ නාට්‍යය යි.

(............)

28) 'G' අක්ෂරයෙන් සඳහන් වන සංවාදය අයත් නාට්‍යය රචනා කළ නාට්‍යකරුවාගේ තවත් කෘතියක් වන්නේ,

1) Uncle Vanya 2) Cherry Orchard 3) Lower Depths
4) Three Penny Opera 5) Wild Duck

(............)

29) 'E' අක්ෂරයෙන් ඉදිරිපත් වන නාට්‍යයට අයත් වන චරිතයක් පහත නම් අතර සඳහන් වේ. එය තෝරන්න.

1) සාගරිකා 2) වාසුලදත්තා 3) වසන්තසේනා
4) ප්‍රියංවදා 5) මදනිකා

(............)

30) 'D' අක්ෂරයට අදාළ සංවාදය අයත් නාට්‍යය වන්නේ,

1) ඇන්ටිගනි ය. 2) ඊඩිපස් ය. 3) සුබ සහ යස ය.
4) ජුලියස් සීසර් ය. 5) හුණුවටයේ කථාව ය.

(............)

31) දේශීය නාට්‍ය කලාවේ වේදිකා තාක්ෂණයේ නව අත්හදා බැලීමක් ලෙස කැරකෙන වේදිකාව භාවිතා කරමින් නිර්මාණය කරන ලද නාට්‍යය වනුයේ,

1) ඒකට මට හිනා හිනා 2) ගජමන් පුවත 3) ජනේලය
3) බක්මහ අකුණු 4) බක්මහ දීගය

(............)

32) **"කොතුර්නෝස්"** භාවිතා වුයේ,

1) ග්‍රීක නළුවන්ගේ රංගවස්ත්‍රාභරණවල ය. 2) නෝ වෙස් මුහුණු වලදී ය.
3) කාබුකි සංගීතය තුළ ය. 4) එලිසබතීන රංග ශාලාව තුළ ය.
5) රෝම නාට්‍ය කලාව තුළ ය.

(............)

33) **"මීඩියා"** නාට්‍යය නිර්මාණය කළේ,

1) හෙන්රික් ඉබ්සන් විසිනි. 2) බර්නාඩ් ෂෝ විසිනි. 3) මොලියර් විසිනි.
4) ප්ලෝටස් විසිනි. 5) යුරිපිඩීස් විසිනි.

(............)

34) එලිසබතීන රංගයේ දී භාවිතා වූ ප්‍රයෝගයකි.

1) පාලමක් යොදා ගැනීම.
2) වක්‍ර මංචකයක් යොදා ගැනීම.
3) වේදිකාවේ ඇතුළත ශබ්ද නිකුත් කිරීම.
4) කක්ෂ්‍යා විභාගය භාවිතා කිරීම.
5) වෙස් මුහුණු භාවිත කිරීම.

(............)

35) **"ඇන්ටිගනී"** නාට්‍යය,

1) රචකයා විඳි අත්දැකීමකින් නිර්මාණය වූවකි.
2) මිථ්‍යා ප්‍රබන්ධයකින් නිර්මාණය වූවකි.
3) පුරා කතා ඇසුරින් නිර්මාණය වූවකි.
4) සත්‍ය සිද්ධියක් ඇසුරින් ගොඩ නැඟුනකි.
5) නාට්‍ය කතුවරයා විසින් අලුතින් ම නිර්මාණය කරන ලද්දකි.

(............)

36) මෙම ඡායාරූපයෙන් දැක්වෙන විදේශීය නාට්‍යකරුවා වනුයේ,



1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
2) බර්නාඩ් ෂෝ ය.
3) ලුයිජි පිරැන්ඩෙලෝ ය.
4) ඇන්ටන් චෙකෝෆ් ය.
5) එමිල් සෝලා යි.

(............)

37) නූර්ති ගී අතරට අයත් නොවන්නේ,

1) "පලු පල මල් සපිරි..............." ගීතය යි.
2) "දන්න වංහුං අප කන්නසාමි................" ගීතය යි.
3) "උත්තමවන් ලොව පතලා................" ගීතය යි.
4) "බෝ දෝස් කියා............" ගීතය යි.
5) "අඹ දඹ නාරං කෙසෙල් දෙල්.........." ගීතය යි.

(............)

38) 1957 දී ගුණසේන ගලප්පත්තියන් විසින් නිෂ්පාදනය කරන ලද කවි නාඩගම් ලක්ෂණ අන්තර්ගත නාට්‍ය වනුයේ,

1) සිංහබාහු
2) මහාසාර
3) මුදු පුත්තු
4) සඳ කිඳුරු
5) රත්තරං


(............)

39) ඉහත නාට්‍ය නාමාවලිය අතරින් කාලිදාසයන් විසින් රචනා කළ කාව්‍යය වන්නේ,

1) මුද්‍රා රාක්ෂය යි.
2) වික්‍රමෝර්වශීය යි.
3) ශාරිපුත්‍ර ප්‍රකරණය යි.
4) ප්‍රියදර්ශිකා යි.
5) නාගානන්දය යි.

(............)

40) මෙම ඡායාරූපයෙන් දැක්වෙන දේශීය නාට්‍යකරුවා වනුයේ,



1) කේ.බී. හේරත් ය.
2) ධම්ම ජාගොඩ ය.
3) රාජිත දිසානායක ය.
4) ධනංජය කරුණාරත්න ය.
5) සුගතපාල ද සිල්වා ය.

(............)

# කොළඹ අධ්‍යාපන කලාපය

අවසාන වාර ඇගයීම - 2016

නාට්‍ය හා රංග කලාව - 13 ශ්‍රේණිය

II පත්‍රය

පැය තුනයි.

## II කොටස

උපදෙස්

- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන සම්පූර්ණ ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

#### දේශීය නාට්‍ය කලාව

01) 1) **"නාට්‍යමය ලක්ෂණ"** යනු කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 4 යි.)

2) **"බෞද්ධ පූජාකර්ම වල නාට්‍යමය ලක්ෂණ ඇතුළත් ව ඇත."** මෙහි සත්‍යතාව තහවුරු කරන්න. (ලකුණු 5 යි.)

3) ශාන්තිකර්ම යනු මොනවාදැයි පැහැදිලි කර, පහතරට ප්‍රදේශයේ ප්‍රධාන ශාන්තිකාර්මයක ඇතුළත් නාට්‍යමය ලක්ෂණ සහිත අවස්ථා පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 6 යි.)

02) 1) නාඩගම් නාට්‍ය කලාව තුළ වූ සුවිශේෂී ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 4 යි.)

2) නාඩගම් මෙරට ප්‍රචලිත වන්නට පෙර මෙරට තිබූ ගැමි නාට්‍යයන් මොනවාදැයි සඳහන් කර, එම ගැමි නාටකවල පොදුවේ දක්නට ලැබුණු ලක්ෂණ හා වෙනස්කම් ලියා දක්වන්න. (ලකුණු 5 යි.)

3) ආදි විශ්ව විද්‍යාලයීය නාට්‍ය කලාව නූර්ති, මිනර්වා ආදී නාට්‍ය කලාවන්ට වඩා වෙනස් වූයේ කෙසේදැයි විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 6 යි.)

03) 1) **"සුබ සහ යස"** නාට්‍යයේ ඇති ඓතිහාසික පසුබිම කුමක් ද? (ලකුණු 4 යි.)

2) ඓතිහාසික මූලාශ්‍රයට වඩා නාට්‍යකරුවා නාට්‍ය තුළ කර ඇති වෙනස්කම් වල අපූර්වත්වය කෙබඳු දැයි විමසන්න. (ලකුණු 5 යි.)

3) **"සුබ සහ යස නාට්‍ය තත්කාලීන දේශපාලනික වාතාවරණය විවරණය කළ බව කියවේ."** මෙහි සත්‍යතාවය ද පහදමින් මෙම නාට්‍ය තුළ මනුෂ්‍යත්වය පිළිබඳ ගෙන හැර දක්වන ජීවිත දෘෂ්ටිය ද විග්‍රහ කර දක්වන්න. (ලකුණු 6 යි.)

### B කොටස

#### විදේශීය නාට්‍ය කලාව

04) 1) බොහෝ විචාරකයින්ට අනුව **"සොෆොක්ලිස්ගේ"** ශ්‍රේෂ්ඨ තම ඛේදාන්තය වනුයේ **"ඊඩිපස්"** නාට්‍යය යි. එහෙත් **"හේගල්"** නැමැති දාර්ශනිකයාගේ මතයට අනුව, සොෆොක්ලිස්ගේ ශ්‍රේෂ්ඨතම වේදාන්තය වනුයේ **"ඇන්ටගනී"** නාට්‍යය යි. හේතු සැකවෙින් දක්වන්න. (ලකුණු 4 යි.)

2) ග්‍රීක නාට්‍ය ශෛලිය තුළ ඇති විශේෂ ලක්ෂණ **"ඇන්ටගනී"** නාට්‍ය ඇසුරින් විමසන්න. (ලකුණු 5 යි.)

3) ඇන්ටිගනී නාට්‍යයේ චරිත තුළින් ලද හැකි ජීවිතාවබෝධය චරිත **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6 යි.)

05) 1) නෝ හා කබුකි නාට්‍ය කලාවේ ප්‍රභවයන් පිළිබඳ වෙන වෙන ම සඳහන් කරන්න. (ලකුණු 4 යි.)

2) නෝ සහ කබුකි රංග ශෛලීන් හි වෙනස්කම් දක්වන්න. (ලකුණු 5 යි.)

3) නෝ නාට්‍ය හා කබුකි නාට්‍ය සම්ප්‍රදායන් තුළ තිබූ නාට්‍ය වර්ගීකරණයන් පිළිබඳ විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 6 යි.)

06) 1) හෙන්රික් ඉබ්සන් විසින් භාවිත කළ **"යථාර්ථවාදී"** නාට්‍ය සම්ප්‍රදාය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 4 යි.)

2) **"රූකඩ ගෙදර"** නාට්‍ය තුළ ඔහු භාවිත කර ඇති සුවිශේෂී නාට්‍යමය උපක්‍රම මොනවාදැයි නිදසුන් මගින් පහදන්න. (ලකුණු 5 යි.)

3) **ශාකුන්තලය නාට්‍යයේ සකුන්තලාගේ** චරිතයත්, **ඇන්ටිගනී නාට්‍යයේ ඇන්ටිගනීගේ** චරිතයත් සමග රූකඩ ගෙදර නාට්‍යයේ නෝරාගේ චරිතය සංසන්දනය කරමින් එම චරිතය තුළ ඔබ දකින සුවිශේෂීතාවය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 6 යි.)